www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාණ්ඩුව බොරු චෝදනා මත හිටපු ඇමති බන්ධනාගාරගත කරයි

## Sri Lankan government jails former minister on trumped up charges

**විජේ ඩයස් විසිනි**
**2007 අප්‍රේල් 3**

ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ තමන්ගේ ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) ප්‍රධාන නායකයන් දෙදෙනෙකුට එරෙහිව පොලිස් හා අධිකරනමය දඩයමකට මුල පුරා තිබේ. පෙබරවාරි 9 වන දා නෙරපා හරින තෙක් ම ඔවුහු දෙදෙනා ඔහුගේ කැබිනෙට්ටුවේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන්ව සිටියහ. වරාය හා ගුවන් සේවා ඇමති මංගල සමරවීරට සහ වරාය සංවර්ධන ඇමති ශ්‍රීපති සූරියආරච්චිට එලෙස අඩන්තේට්ටම් කිරීම මගින් රාජපක්ෂ ආන්ඩුවේ බිඳෙනසුලු ස්වභාවය අවධාරනය වනවා පමනක් නො වේ. එය පැන නගින කවරාකාර දේශපාලනික විරුද්ධත්වයකට එරෙහිව වුව ආන්ඩුව යොදා ගන්නා විධික්‍රම පිලිබඳව කෙරෙන තියුනු අනතුරු ඇඟවීමක් ද වේ.

ජාතික උරුමයන් පිලිබඳ ඇමති හා ශ්‍රීලනිප භාන්ඩාගාරික වන අනුර බන්ඩාරනායක ද නෙරපා හැරීමට ලක් විය. හිටපු ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංගගේ සොහොයුරා වන බන්ඩාරනායක රාජපක්ෂ සමග තමන්ට තිබූ මතභේද මග හැර ගෙන යලි ගාලට එක් වී ඇත. එහෙත් අනෙක් දෙදෙනා ඒකාධිපති පාලන විධික්‍රම, දූෂනය සහ 2005 ජනාධිපතිවරනයට පෙර දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග ගනුදෙනුවකට එළඹීම සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ රාජපක්ෂ විවේචනය කර තිබේ.

රාජපක්ෂ යන්තම් ඡන්දය දිනා ත්තේ එල්ටීටීඊය මැතිවරනය වර්ජනය කරන ලෙස කැඳවුම් කිරීමෙන් පසුව නිසා මෙම අවසන් චෝදනාව ඔහුට විශේෂයෙන් ම හානිකර වේ. ඡන්දය වර්ජනය කල බොහෝ දෙමල ජනයා රාජපක්ෂගේ විරුද්ධවාදියා වූ එක්සත් ජාතික පක්ෂයට (එජාප) ඡන්දය දිය හැකිව තිබූ අතර එසේ වී නම් තත්වය අනෙක් අතට හැරිය හැකිවද තිබින. ශ්‍රී ලංකාවේ පවතින වාර්ගිකත්වයෙන් ඇලලී ගිය දේශපාලනික වාතාවරනය තුල දී එල්ටීටීඊය සමග පයුරුපාසනය පිලිබඳ චෝදනාවක් යනු රාජ ද්‍රෝහිත්වය පිලිබඳ චෝදනාවක් හා සම වන්නකි. පසු ගිය වසර තිස්සේ ඔහු සිංහල දේශප්‍රේමයක ආස්ථානයට අනුගත වී දිවයින යලි යුද්ධය තුලට ල්වා ඇති තතු යටතේ චෝදනාව සම්බන්ධයෙන් රාජපක්ෂ විශේෂයෙන් ම සංවේදී ය.

සමරවීරට සහ සූරියආරච්චිට රාජපක්ෂ සමග කිසිදු මූලික දේශපාලනික මතභේදයක් නැත. 2005 නොවැම්බර් මැතිවරනය අතරතුර දී දෙදෙනා ම ඔහුගේ සමීප දේශපාලන සහකරුවන් මෙන් ම ප්‍රධාන උද්ඝෝෂකයෝ ද වූහ. ආන්ඩුවට පාර්ලිමේන්තුවේ බහුතරය හිමි කර දෙමින් ඊට එක් වූ එජාප විරුද්ධ පක්ෂ සාමාජිකයන්ට රාජපක්ෂ විසින් තනතුරු ලබා දීම හේතුවෙන් ජනවාරියේ දී තත්වයෙන් පහල වැටීමට කලින් සමරවීර විදේශ ඇමතිවරයා විය. සමරවීර සහ සූරියආරච්චි තම විරෝධය පල කිරීමට පටන් ගත්තේ මෙම උපාමාරුවලින් අනතුරුව ය.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශයට අයත් වාහනයක් අනිසි ලෙස පරිහරනය කිරීම පිලිබඳ චෝදනා මත පොලීසිය මාර්තු 17 දා සූරියආරච්චි අත් අඩංගුවට ගත්තේ ය. අත් අඩංගුවට ගැනීම සිදු කරන ලද්දේ සූරියආරච්චි තනතුරින් පහ කිරීමෙන් යන්තම් දින 10කට පසුව එනම් පෙබරවාරි 26 වන දා තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ලද පැමිනිල්ලකින් අනතුරුව අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව (සීඅයිඩී) විසිනි.

සාපේක්ෂ වශයෙන් ගත් කල චෝදනාව සුලු පරිමාන වූවක් ය යන කරුන තිබිය දී ම, සූරියආරච්චිට ඇප දීම ප්‍රතික්ෂේප කොට ඔහු රක්ෂිත බන්ධනාගාරගත කොට තිබේ. නඩු වාර තුනක දී ම මහේස්ත්‍රාත් අධිකරනය ඔහුගේ රැඳවුම් කාලය දීර්ඝ කලේ ය. විවිධ ජන මාධ්‍ය වාර්තාවලින් ඇඟවෙන්නේ මෙකී දූෂන චෝදනා මත ම සමරවීර ද අත් අඩංගුවට ගැනීමට ඉඩ ඇති බව යි.

ශ්‍රී ලංකාව තුල ආවේනික ලක්ෂනයක් බවට පත්ව ඇති ආන්ඩුවේ ආයතනවල පැතිර පවතින දූෂනය තුරන් කිරීම සමග රාජපක්ෂගේ ක්‍රියාවන්ට කිසිදු සම්බන්ධයක් නැත. ඇමතිවරුන් ආන්ඩුවේ දේපල අනිසි ලෙස පරිහරනය කිරීම අවසන් කිරීම සම්බන්ධයෙන් ඔහු බැරෑරුම් ආකල්පයකින් යුතුව

කටයුතු කරන්නේ නම් ඔහුගේ කැබිනෙට්ටුව තුල සිටින්නවුන්ගෙන් බොහෝ දෙනා මේ වන විට එම බන්ධනාගාරය තුල ම සිටිනු ඇත. සැබවින් ම සිදු වී ඇත්තේ තමන්ගේ අස්ථාවර පාලක සන්ධානය එකට බැඳ තබා ගැනීම සඳහා විවිධ වරප්‍රසාද සමග ඇමති තනතුරු බෙදා දීමේ පිලිවෙත කෙරෙහි රාජපක්ෂ බරපතල ලෙස විශ්වාසය තබා තැබීම යි.

ආන්ඩුවේ වාහනයක් අනිසි ලෙස පරිහරනය කිරීම පිලිබඳ බොරු චෝදනාව දේශපාලනික විරෝධය නිහඬ කිරීමේ උපාය මාර්ගයකි. රාජපක්ෂ උත්සුකව සිටින්නේ සමරවීර, සූරියආරච්චි හෝ අන් අයෙකු චේවා යුද්ධයට හා පිරිහෙන ජීවන තත්ත්වයන්ට එරෙහිව වර්ධනය වන වඩා පුලුල් මහජන විරුද්ධත්වයක කේන්ද්‍රය ලක්ෂ්‍යයක් බවට පත් වීම වලක්වා ලීම පිලිබඳව යි. රාජපක්ෂ සිය රාජකාරි භාර ගත් තැන් සිට මේ දක්වා කාලය තුල යලි ඇරඹූ සටන් හේතුවෙන් 4,000කට වැඩි ජනතාවක් ඝාතනයට ලක්ව ඇති අතර උතුරේ හා නැගෙනහිරේ 250,000කට වැඩි ජනතාවක් අවතැන් වී ඇත. මිලිටරි වැය දැවැන්ත ලෙස ඉහල දමන තතු තුල දී වැඩ කරන ජනතාවගේ පුලුල් ස්තරයකට දුෂ්කරතාවන් ඇති කරමින් උද්ධමන අනුපාතය ඉලක්කම් දෙකේ අගයක් කරා ලඟා වී තිබේ.

සාකච්ඡාමය විසඳුමක් ඔස්සේ යුද්ධය අවසානයකට ගෙන ඒමට අනුග්‍රහ දක්වන ශ්‍රීලනිප සාමාජිකයන් හා එජාපයෙන් "පිල් මාරු කලවුන්" ද සමග ජාතික හෙල උරුමයේ (ජාහෙඋ) විවෘත යුද වැද්දන් ද ඇතුලත් කර ත් රාජපක්ෂගේ අපාලිත සන්ධානය තුල, පුලුල්ව පැතිර පවතින මහජන විරෝධය මගින් පැහැදිලිව ම තියුනු වූ ආතතිකර තතු නිර්මානය කරනු ලැබේ. විවිධාකාර කන්ඩායම් මත ද ජනාධිපති බලතල යොදා ගෙන පනවනු ලබන ක්‍රියා පිලිවෙත් මත ද අඩමාන ලෙස සිය දෙපය තබා සිටින රාජපක්ෂ වඩ වඩාත් බොනපාට්වාදී වූ ක්‍රියා කලාපයක් ඉටු කරමින් සිටී. ආරක්ෂාව හා මූල්‍ය කටයුතු සම්බන්ධ ප්‍රධාන තනතුරු ඔහු තමන් භාරයේ ම පවත්වා ගෙන යයි. ඔහුගේ සොහොයුරා වන ගෝඨාභය රාජපක්ෂ ඉහල පෙලේ ආරක්ෂක ලේකම් තනතුර දරා සිටී.

තමන් නෙරපා හැරීමෙන් පසු සමරවීර කියා සිටියේ රාජපක්ෂ යුද්ධය ගෙන යන ආකාරය සම්බන්ධයෙන් තමන් පසු ගිය වසරේ තම නොඑකඟතාවන් මතු කල බව යි. පෙබරවාරි මස අග ශ්‍රීලනිප ලේකම්වරයා වෙත ලියූ ලිපියක දී ඔහු මෙසේ ප්‍රකාශ කලේ යඃ "රට තුල සිදු වන මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිලිබඳවත් ජාත්‍යන්තර ප්‍රජාවගෙන් ලැබී ඇති අසතුටුදායක ප්‍රතිචාරය පිලිබඳවත්, විශේෂයෙන් ම ඒ වන තෙක් ම ජාත්‍යන්තර ප්‍රජාව විසින් හුදෙකලා කරනු ලැබ සිටි එල්ටීටීඊය යලි වතාවක් තමන්ට වාසිදායක තත්ත්වයක් සකස් කර නිමින් සිටින්නේ ය යන කරුන පිලිබඳවත් සාකච්ඡා කරනු පිනිස වේලාවක් වෙන් කර දෙන ලෙස පසු ගිය ඔක්තෝබරයේ දී මම ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටියෙමි."

"අතුරුදන් වීම්" හා ඝාතන නනාවක් ද ඇතුලුව ශ්‍රී ලංකා මිලිටරිය ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් නින්දිත ලෙස උල්ලංඝනය කිරීමට එරෙහිව ජාත්‍යන්තරව මතු වූ විරෝධතා පිලිබඳව විදේශ ඇමතිවරයා ලෙස සමරවීර පැහැදිලිව ම උත්සුක විය. "සාම්පූර් අල්ලා ගැනීම දක්වා ආන්ඩුව ගත් ක්‍රියා මාර්ග නිවැරදි යැයි ජාත්‍යන්තර ප්‍රජාව විශ්වාස කරයි. කෙසේ වුව ද, ත්‍රිකුනාමලයේ දී සිසුන් පස් දෙනෙකු ඝාතනය කිරීම සහ මුතුර්හි දී [ප්‍රත්‍යය පදනම් කොට ත් ආධාර සපයන සංවිධානයක් වූ] ඒසීඑෆ්යට සම්බන්ධ ආධාර සේවකයන් 17 දෙනෙකු ඝාතනය කිරීම මගින් සියල්ල උඩු යටිකුරු කරනු ලැබුනි" යි ඔහු කියා සිටියේ ය.

සමරවීර කනස්සල්ලට පත්ව සිටින්නේ කොලඹ සමස්ත දේශපාලන සංස්ථාපිතය ම තල්ලුව දෙන එවන් වූ යුද්ධය පිලිබඳව නො වේ. ආන්ඩුවට ජාත්‍යන්තර සහාය නැතිව යාමට පවතින ඉඩකඩ පිලිබඳව යි. ඔහු මෙසේ අදහස් දැක්වී යඃ "[මිලිටරියේ ඒකාධිපති ක්‍රියාවන් පිලිබඳ] චෝදනාවලින් එකක් හෝ තහවුරු වූයේ නම් එමගින් ත්‍රස්තවාදයට එරෙහි සටනට දැවැන්ත තර්ජනයක් ඉදිරිපත් වනු ඇත." එල්ටීටීඊ පාලනය යටතේ පවතින ප්‍රදේශය අත්පත් කර ගැනීම සඳහා පසු ගිය ජූලි මස බරපතල මිලිටරි ආක්‍රමන මාලාවක් ම දියත් කිරීම ඔස්සේ ආන්ඩුව 2002 සටන් විරාම ගිවිසුම පැහැදිලි ලෙස ම උල්ලංඝනය කොට තිබීම සම්බන්ධයෙන් එක්සත් ජනපදය හා අවශේෂ " ජාත්‍යන්තර ප්‍රජාව" සැබවින් ම මුනිවත රකියි. අගෝස්තුවේ දී ඒසීඑෆ්හි ආධාර සේවකයන් ම්ලේච්ඡ ලෙස ඝාතනයට ලක් කිරීම වැනි සිද්ධීන් සම්බන්ධයෙන් පවා පැන නැගුනේ නිහඬ විරෝධතාවක් පමනකි.

ඊස්රායලයට එරෙහිව පලස්තීන ජාතික අධිකාරය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් සම්බන්ධයෙන් පසු ගිය නොවැම්බරයේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය තුල කල ඡන්ද විමසීමක දී ශ්‍රී ලංකාවේ විදේශ ඇමතිවරයා ලෙස ඊට සහභාගි වී ඡන්දය දීමෙන් වැලකී සිටීම මගින් පලස්තීනයන්ට සහාය දැක්වීම සම්බන්ධයෙන් පෙන්නුම් කල අසමර්ථතාව පිලිබඳව චෝදනා කරමින් රාජපක්ෂ සමරවීරට ප්‍රතිප්‍රහාරයක් එල්ල කර තිබේ. මෙම සිද්ධිය මගින් ඉස්මතු කර දැක්වෙන්නේ දෙදෙනා අතර පවතින දේශපාලනික මතභේදවල සපුරා ම ප්‍රතිපත්ති විරහිත වූ ස්වභාවය පමනකි. බුෂ් පරිපාලනයේ ව්‍යාජ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයට" සහ ඉරාකය හා ඇෆ්ඝනිස්ථානය තුල සිදු කරන නව-විජිතවාදී ආක්‍රමනයන්ට සහාය දෙන්නා වූ ආන්ඩුවක සිටිමින් රාජපක්ෂ හෝ සමරවීර

පීඩිතයන්ගේ ආරක්ෂකයන් ලෙස පෙනී සිටීම හාස්‍යයට කරුනකි.

පෙබරවාරියේ දී සන්ඩේ ලීඩර් පුවත්පතට සමරවීර මෙම උභතෝකෝටිකය ගැන පැහැදිලි කලේ මෙසේ යඃ "එක් පැත්තකින් අපගේ චිරකාලීන මිතුරන්ව සිටි පලස්තීනයන් සිටියා. අරාබි ලෝකය ද අපට අතිශයින් ම සමීප යි. අනෙක් අතින් විශේෂයෙන් ත්‍රස්තවාදයට එරෙහිව අප ගෙන යන සටනේ දී අපගේ ස්ථිරසාර මිතුරෙකු වී සිටින එක්සත් ජනපදයෙන් කෙරුනු ඉල්ලීමක් තිබුනා.... මම ශ්‍රී ලංකාව තුල පවතින ත්‍රස්තවාදී තර්ජනයට එරෙහිව ද සටන් කරනු පිනිස ආචාර්ය කොන්ඩලීසා රයිස් හා අනෙකුත් නිලධරයන් සමග ඉතා යහපත් සබඳතා ගොඩ නගා ගැනීමට සමත් වුනා."

අවසන් වශයෙන් ගත් කල තෝරා ගැනීම එතරම් ම දුෂ්කර වූවක් නොවුනි. සමරවීර මෙසේ පැහැදිලි කලේ යඃ "එක්සත් ජනපදය අපට හැම විට ම උදව් කර තිබෙන අතර ත්‍රස්තවාදයට එරෙහි අපගේ සටනේ දී වැදගත් හවුල්කරුවෙකු හා වැදගත් උපකරනයක් වුනා."

කෙසේ වුව මෙය හුදෙක් සමරවීරගේ හෝ රාජපක්ෂ ආන්ඩුවේ ස්ථාවරය පමනක් නො වේ. ඒ වෙනුවට එය තමන්ගේ ම සාපරාධී "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයට" එක්සත් ජනපද සහාය ලබා ගැනීම පිනිස වොෂින්ටනයේ අපරාධවලට සහාය දී ඇති කොලඹ සමස්ත දේශපාලන සංස්ථාපිතයේ ම ස්ථාවරය වේ.

රාජපක්ෂ වත් සමරවීර වත් ශ්‍රීලනිපයේ කිසිදු කන්ඩායමක් වත් ශ්‍රී ලංකාව තුල, මැද පෙරදිග හෝ ලෝකයේ අන් තැනක සිටින වැඩ කරන ජනතාවගේ අවශ්‍යතාවන් නියෝජනය නො කරයි. මෑතක් වන තුරු ම තමන්ගේ සමීප සහකරුවෙකු වූ මිනිසෙකු අත් අඩංගුවට ගැනීම ගැන සිතා බැලීමට රාජපක්ෂට වූ අධිෂ්ඨානය යනු සමස්ත ජනතාවට ම එරෙහිව ආන්ඩුව විසින් සූදානම් කෙරෙමින් පවතින පොලිස් රාජ්‍ය විධික්‍රමයන් පිලිබඳව කෙරෙන තියුනු අනතුරු ඇඟවීමකි.

© www.wsws.org